ශ්‍රේණිය 11

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- පුරවැසි අධ්‍යාපනය i,ii

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ...........................

කාලය : පැය තුනයි

**1පත්‍රය**

**සැලකිය යුතුයි**
**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ X ලකුණ යොදන්න

01. ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය හිමිව ඇත්තේ,
(1) ජනතාවටය. (2) ජනාධිපතිටය. (3) පාර්ලිමේන්තුවටය. (4) අධිකරණයටය.

02. ජනමතය නියෝජනයට ඇති ඉඩකඩ වඩාත් පුළුල් වන්නේ,
(1) බහු පක්ෂ ක්‍රමයක් තුළිනි. (2) ද්වි පක්ෂ ක්‍රමයක් තුළිනි.
(3) ඒක පක්ෂ ක්‍රමයක් තුළිනි. (4) තරගකාරී පක්ෂ ක්‍රමයක් තුළින.

03. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය යටතේ පාලකයන් තෝරාගනු ලබන්නේ,
(1) සමානුපාතික ඡන්ද ක්‍රමයෙනි. (2) සර්වජන ඡන්ද බලයෙනි.
(3) සරළ බහුතර ඡන්ද ක්‍රමයෙනි. (4) ජනමත විචාරණයෙනි.

04. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම හඳුන්වන්නේ,
(1) බලය බෙදාහැරීම යනුවෙනි. (2) බලය මධ්‍යගත කිරීම යනුවෙනි.
(3) බලය විමධ්‍යගත කිරීම යනුවෙනි. (4) බලය කේන්ද්‍රගත කිරීම යනුවෙනි.

05. ඒකීය ආණ්ඩුක්‍රමයක නීති පැනවීම සම්බන්දයෙන් උත්තරීතර වන්නේ
(1) මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයයි . (2) මධ්‍යම ආණ්ඩුවේ විධායකයයි .
(3) ප්‍රාන්ත ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයයි . (4)ප්‍රාන්ත ආණ්ඩුවේ විධායකයයි .

06. ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සතු බලතල දෙකක් අඩංගු පිළිතුර තෝරන්න
(1) මූල්‍ය හා ජාතික ආරක්ෂාව. (2) මහාමාර්ග හා අධ්‍යාපන.
(3) මූල්‍ය හා අධ්‍යාපන. (4) ජාතික ආරක්ෂාව හා මහාමර්ග.

07. බහු සංස්කෘතික ජන සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළයුතු ගුණාංගයක් වන්නේ,
(1) අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම. (2) අන්‍ය ආගම් වැළඳගැනීම.
(3) නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය අගය කිරීම. (4) අන්‍ය මත නොසලකා කටයුතු කිරීම.

08. යහපාලනයක් ඇති රටක පාලකයන්ගේ වගකීමක් වන්නේ,
(1) වංචා හා දූෂණයෙන් තොරව කටයුතු කිරීම. (2) මූල්‍ය අවභාවිතාවන්ට මුල්තැනක් දීම.
(3) ජනතා සහභාගීත්වයක් නැතිව පාලනය කරීම. (4) රාජ්‍ය පාලනය නිළධාරීන්ට බාරදීම.

09. බහු සංස්කෘතික ජන සමාජයක සංහිඳියාව ඇතිකරගැනීම සඳහා කළහැකි හොඳම ක්‍රියාමාර්ගය වන්නේ,
(1) ඕනෑම අවස්ථාවක අරගල කිරීම. (2) සාමූහිකත්වය වර්ධනය කිරීම.
(3) සංස්කෘතීන් අතර තරගයක් ඇතිකරීම . (4) සංස්කෘතික විවිධත්වය වර්ධනය කිරීම.

10. ආර්ථික නොවන භාණ්ඩයක් ඇතැම්විට ආර්ථික භාණ්ඩයක් විය හැකිය ඊට උදාහරණයක් වන්නේ,
(1) ඖෂධ (2) ආහාර (3) ජලය (4) ඇඳුම්

11. A වැඩ ලෝකය පුළුල්වීම
B සේවා වියුක්තිය ඉහළයාම
C ඕනෑම රටක ජීවත්වීමට නොහැකිවීම
D ගෝලීය වෙළඳපොල පුළුල්වීම
- ඉහත වගන්ති අතුරින් ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ ඇතුලත් වගන්ති වනුයේ,

(1) AB (2) CD (3) BD (4) AD

12. සංවර්ධනයේදී ආර්ථිකය සතු සම්පත් අනාගත පම්පරාවටද ඉතිරි කරමින් වර්තමාන අවශ්‍යතා ඉටුකර ගැනීම හඳුන්වනු ලබන්නේ,
(1) තිරසාර සංවර්ධනය නමින්ය (2) සමාජ සංවර්ධනය නමින්ය
(3) පුද්ගල සංවර්ධනය නමින්ය (4) ආර්ථික සංවර්ධනය නමින්ය

13. ගැටුම් නිරාකරණයේදී භාවිතා කරන සාකච්ඡා ක්‍රමයේ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ
(1) සේව්‍ය සේවක දෙපර්ශවයක් සිටීම (2) පෞද්ගලික ගැටුම් පමණක් විසඳීම
(3) නීතියේ ප්‍රතිපාදන අනුව කටයුතුකිරීමට සිදුවීම (4) දෙපාර්ශවයටම ජය - ජය විසඳුම් ලැබීම

14. වාර්ගිකත්වය, දේශපාලනය, ආගමික මතවාද, සමාජ හා ආර්ථික තත්ත්වය යන කරුණු
(1)ගැටුම ඇතිවන පාර්ශවයන්ය (2)ගැටුම ඇතිවන මූලයන්ය
(3)ගැටුම නිරාකරණ ක්‍රමයන්ය (4)ඉහත සියල්ල නිවැරදිය

15. ගැටුම් ත්‍රිකෝණය හඳුන්වා දෙනු ලැබුයේ
(1) ජොහාන් ගැල්ටුන්ය (2) මහාචාර්ය ගාර්ය (3)කේ. සී. වියර්ය (4) මහාචාර්ය ඒ. වී. ඩයිසිය

16. A , B ප්‍රකාශ ඇසුරින් පිළිතුරු සපයන්න
A වාණිජ ආරවුල් විසඳීමේ බලය පළාත්බද මහාධිකරණය සතු බලයකි.
B ජනාධිපතිවරණ පෙත්සම් විභාගකිරීමේ බලය අභියාචනාධිකරණය සතු බලයකි.
(1) A හා B දෙකම සත්‍ය වේ (2) A සත්‍ය වන අතර B අසත්‍යවේ
(3) A අසත්‍ය වන අතර B සත්‍යවේ (4) A හා B දෙකම අසත්‍ය වේ

17. මත්ද්‍රව්‍ය විකිණීම හා ළමා අපරාධ සම්බන්ධයෙන් බලපාන නීතිය වන්නේ,
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය. (2) සිවිල් නීතිය. (3) අපරාධ නීතිය. (4) ජාත්‍යන්තර නීතිය.

18. රටක පාලනය, නීතියේ උත්තරීතර බව, අනුව සිදුකිරීම හඳුන්වන්නේ
(1) නීතියේ ස්වාධීනත්වය යනුවෙනි. (2) නීතියේ ආධිපත්‍යය යනුවෙනි.
(3) නීතියේ සවිරත්වය යනුවෙනි. (4) නීතියේ පරමාධිපත්‍යය යනුවෙනි.

19. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් ගණන වන්නේ,
(1) තුන්දෙනෙකි. (2) පස්දෙනෙකි. (3) දසදෙනකි. (4) දොළොස්දෙනකි.

20. නිදහස් මත දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය අයත්වන මානව හිමිකම් කාණ්ඩය වන්නේ,
(1) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්ය. (2) ආර්ථික හා සිවිල් අයිතිවාසිකම්ය.
(3) මානව හා සංස්කෘතික අයිතිවාසිකම්ය. (4) දේශපාලන හා ආථික අයිතිවාසිකම්ය.

21. ශ්‍රී ලංකාවට ප්‍රථම වරට කැබිනට් ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදුන් ආණ්ඩුක්‍රමය වන්නේ,
(1) 1910 මැනිං (2) 1931 ඩොනමෝර් (3) 1947 සෝල්බරි (4) 1972 ප්‍රථම ජනරජ

22. ශ්‍රී ලංකාවට විධායක කාරක සභා ක්‍රමයක් හඳුන්වාදුන් ආණ්ඩුක්‍රමය වන්නේ
(1) 1833 කෝල්බෲක් (2) 1910 මැනිං (3) 1931 ඩොනමෝර් (4) 1947 සෝල්බරි

23. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව නිවැරිදි පිළිතුර තෝරන්න
(1) ප්‍රථම වරට ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් හඳුන්වාදෙන ලදි
(2) ප්‍රථම වරට විධායක ජනාධිපතිධූරයක් හඳුන්වාදෙන ලදි
(3) ප්‍රථම වරට අධිකරණ සේවා කොමිෂන් සභාවක් හඳුන්වාදෙන ලදි
(4) ප්‍රථම වරට මූලික අයිතිවාසිම් හඳුන්වාදෙන ලදි

24. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් කීපයක් පහත දැක්වේ.
A ජල සම්පාදනය
B මංමාවත් ආරක්ෂා කිරීම
C අතුරු පාරවල් ඉදිකිරීම
D පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාම
ඉහත කාර්යයන් අතරින් පෙදු උපයෝගීතා සේවා වලට අයත්වන පිළිතුරු කාණ්ඩය තෝරන්න
(1) A හා B (2) B හා D (3) A හා C (4) A හා D

25. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකයේ බලතල හා කර්යයක් නොවන්නේ,
(1) නීති සම්මත කිරීම (2) නීති විවරණය කරීම (3) ප්‍රශ්න ඇසීම (4) මූල්‍ය පාලනය

26. මානව හිමිකම් අතරින් තෝරාගත් ප්‍රධානතම අයිතීන් මූලික නීතියට ඇතුළත් කරීම හැඳින්විය හැක්කේ
(1) මානව හමිකම් ලෙසය (2) මූලික හමිකම් ලෙසය
(3) දේශපාලන අයිතිවාසිම් ලෙසය (4) මූලික අයිතිවාසිම් ලෙසය

27. මානව අයිතිවාසිකම් සුවිශේෂී මූලධර්මයන් මත පදනම්වී ඇත. එම මූලධර්මයන් වන්නේ,
(1) සාධාරණත්වය හා සමානාත්මතාවයයි. (2)යුතුකම් හා අයිතිවාසිකම්ය
(3) අයිතිවාසිම් හා සාධාරණත්වයයි (4) යුතුකම් හා සමානාත්මතාවයයි

28. මානව හිමිකම් භුක්තිවිඳීමේදී කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ අරමුණෙන් සීඩෝ සම්මුතිය සම්මත කරනු ලැබූයේ කවදාද?
(1) 1969/10/24 (2) 1979 / 12/18 (3)1989 /11/20 (4) 1999/08/06

29. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂමට අයත් කාර්යයක් වන්නේ,
(1) මානව හිමිකම් උල්ලංඝනය වීම් විර්ශනය කිරීම (2) මානව හිමිකම් උල්ලංඝනය කළ අයට දඬුවම්දීම
(3) මානව හිමිකම් උල්ලංඝනයන් ප්‍රවර්ධනය කිරීම (4) අධිකරණය දී ඇති දඬුවම් ලිහිල් කිරීම

30. මානව හිමිකම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න
(1) මානව අයිතිවාසිකම්වලට ඉඩදීමෙන් රටක සංවර්ධනය අඩාලවේ
(2) සෑම මානව අයිතිවාසිකමක්ම මූලික අයිතිවාසිකමක්වේ
(3) මානව හිමිකම් ලැබීමට වයස් සීමාවක් ඇත
(4) මානව හිමිකම් විශ්වීය සංකල්පයකි

31. මිනිස් ක්‍රියාකාරම් හේතුවෙන් ඇතිවන පාරිසරික ගැටළු ඇතුළත් වරණය තෝරන්න
(1) සුනාමි, අම්ල වැසි, ජලය දූෂණයවීම
(2) ලැව් ගිණි, භූමි කම්පා, හා වාතය දූෂණය
(3) භූමි කම්පා, ජලය දූෂණයවීම, ඕසෝන් ස්ථරය විනාශවීම
(4) සාගර ජල මට්ටම ඉහළයාම, ජලය දූෂණයවීම, වාතය දූෂණය

32.මිනිස් ක්‍රියාකාරකම් නිසා පමණක් ජලය දූෂණයවන අවස්ථා ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) පතල් හෑරීම, භූමිකම්පා, නායයෑම් (2) පතල් හෑරීම, මැණික් ගැරීම, ගල් අඟුරු කැනීම
(3) සුනාමි, ගිණිකඳු පිපිරීම, නායයෑම් (4) පතල් හෑරීම, මැණික් ගැරීම, භූමිකම්පා

33. ජෛව පරිසරයට හානි පැමිණවීමෙන් සිදුවන හානියක් නොවන්නේ,
(1)තුලිතතාවය බිඳවැටේ. (2) ආවේනික සත්ව ප්‍රජාවන් විනාශ වේ.
(3) ආහාර දාම බිඳවැටේ. (4) සමාජ සබඳතා විනාශවේ.

34. "සංවර්ධනය යනු ලෝක ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරීමයි." මෙම අදහස ඉදිරිපත්කර ඇත්තේ,
(1) බ්‍රන්ඩ්ට්ලන්ඩ් කොමිසමයි (2) මහත්මා ගාන්ධිතුමාය
(3) එක්සත් ජාතීන්ගේ සංවිධානයයි (4) යුනෙස්කෝ ප්‍රකාශනයයි

35. සමාජ පරිසරය යන්නෙන් අදහස් වන්නේ,
(1) මිනිසා විසින් ගොඩනගන ලද්දකි (2) භෞතික සංරචක වලින් ගොඩනගන ලද්දකි
(3) ස්වභාවිකව ගොඩනැගුන සංසිද්ධීන්ය (4) ස්වභාවික හා මිනිසා යන දෙකෙහි මිශ්‍රණයකි

36. ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප දෙක ඇතුලත් පිළිතුර තෝරන්න
(1) ජාත්‍යන්තර වෙළඳාම හා රාජ්‍ය උපාය සබඳතා (2) රාජ්‍ය උපාය සබඳතා හා යුධ උපාය සබඳතා
(3) ජාතික ආරක්ෂාව හා යුධ උපාය සබඳතා (4)ජාත්‍යන්තර වෙළඳාම හා යුධ උපාය සබඳතා

37. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණදී ඇති ආර්ථික අර්බුධයට පිළියම් ලෙස මූල්‍යාධාර අපේක්ෂා කරන ආයතනය වන්නේ,
(1) ලෝක බැංකුව (2) ආසියානු සංවර්ධන බැංකුව
(3) අන්තර්ජාතික මූල්‍ය අරමුදල (4) එක්සත් ජාතීන්ගේ අර්ථික හා සමාජ මණ්ඩලය

38. ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග ජයගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමර්ගයක් වන්නේ,
(1) පරිභෝජන වියදම් ඉහළ දැමීම (2) යටිතල පහසුම් සංර්ධනය
(3) ආයෝජන වියදම් ඉහළ දැමීම (4) ධනවත් රටවල් සමග මිතුරු වීම

39.

| අ | ආ |
|---|---|
| 1. ලෝක ආහාර වැඩසටහන | A සංවර්ධනය වන රටවල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම |
| 2. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | B ස්වශක්තිය සහ ධරණීය සංවර්ධනය තහවුරු කරීම |
| 3. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | C සාගින්න හා දරිද්‍රතාව පිටු දැකීම |
| 4. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | D පූර්ණ ළමා සංවර්ධනයක් ඇතිකිරීම |

ඉහත **"අ"** තීරුවේ එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතනයද, **"ආ"** තීරුවේ ඒවායේ අරමුණු ද දක්වා ඇත. අ තීරුවට අනුව පිළිවෙලින් ගැලපූවිට ලැබෙන පිළිතුර තෝරන්න.
(1) ABCD (2) CADB (3) CDAB (4) ADCB

40. බිම්ස්ටෙක් සංවිධානයේ මූලස්ථානය පිහිටා ඇත්තේ,
(1) ඉන්දුනීදියාවේ ජාකර්තා (2) පිලිපීනයේ මැනිලා
(3) බංග්ලාදේශයේ ඩකා (4) ඉනදියාවේ නවදිල්ල

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- පුරවැසි අධ්‍යාපනය

පාසලේ නම : ...........................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

**11පත්‍රය**

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව **ප්‍රශ්න පහකට** පිළිතුරු සපයන්න.

01.

i. ඒකීය ආණ්ඩුක්‍රම පවතින රටවල් දෙකක් නම් කරන්න

ii. ව්‍යවස්ථාදායකයන්ට නියෝජිතයින් තෝරාගැනීමේදී බහුලව භාවිතාවන නියෝජන ක්‍රම දෙක ලියන්න

iii. ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායකයේ ආයතන දෙක නම් කරන්න

iv. මූලික ආර්ථික ප්‍රශ්නවලින් දෙකක් ලියන්න

v. ගැටුම් ඇතිවන මූල දෙකක් ලියන්න

vi. නීති ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. එම දෙක ලියන්න

vii. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන වර්ග තුනෙන් දෙකක් ලියන්න

viii. පරිසරයෙන් ලැබෙන ජීව උපකාරක සේවාවන් දෙකක් සඳහන් කරන්න

ix. මානව අයිතිවාසිකම් දිනාගැනීම සම්බන්ධයෙන් වැදගත්වන අවස්ථා දෙකක් ලියන්න

x. සංවර්ධන මිණුම් ප්‍රධාන කොටස් දෙකකි. එම දෙක ලියන්න (ලකුණු 2x10 = 20)

02. ''රාජ්‍යයේ කැමැත්ත ක්‍රියාවට නැංවීම කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ''

1. ආණ්ඩුක්‍රමවල ස්වරූප 02 නම් කරන්න. (ලකුණු 02)
2. රාජ්‍යයේ අංග ලක්ෂණ වලින් 03 ක් ලියන්න. (ලකුණු 03)
3. a. ආණ්ඩුවේ ප්‍රධාන අංග 03 නම් කරන්න. (ලකුණු 03)

   b. ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 02)

(03) "එකම සමාජයක් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයන් ජීවත් වන්නේ නම් එවැනි සමාජයක් බහු සංස්කෘතික සමාජයක් ලෙස සැලකේ"

1. සංස්කෘතිය පිළිබඳව නිර්වචන ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)
2. බහුසංස්කෘතික සමාජයක දැකිය හැකි මූලික ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
3. a. බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

   b. බහුසංස්කෘතික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීමට එම ගුණංග කොතෙක් දුරට උපකාරීවේ දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(04) "සම්පත් හිඟකම නිසා ඕනෑම ආර්ථිකයක් ගැටළුවලට මුහුණපායි"

1. පරිවර්තන ආර්ථිකයන්හි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

2. වෙළෙඳපොළ අර්ථ ක්‍රමයන් ක්‍රියාත්මක වන රටවල ප්‍රධාන වශයෙන් දැකිය හැකි ස්වරූප තුන දක්වන්න. (ලකුණු 03)

3. - a ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ අර්ථක්‍රමයක ලක්‍ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

   b ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(05) '' නීතිය නොදන සිටීම නිදහසට කරුණක් නොවේ''

1. යුක්තිය ඇති කිරීම පිළිබඳව වැදගත් වන කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

2. නීතියට අදාළ ගුණාංග තුනක් දක්වන්න. (ලකුණු 03)

3. a. දේශීය නීතියේ කොටස් තුන සඳහන් කරන්න. (ලකුණු 03)

   b. මින් එක් නීතියකට අදාළ වන වැරදි, උදාහරණ දක්වමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(06) "මිනිසාට පරිසරයෙන් තොර පැවැත්මක් නොමැත."

1. පරිසර පද්ධතිය සකස් වී ඇති සංරචක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

2. ස්වාභාවික පරිසරයට ඇතුළත් සංසිද්ධීන් තුනක් ලියන්න. (ලකුණු 03)

3. a. පරිසරයෙන් ලැබෙන සේවාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

   b. ඉන් එක සේවාවක් පරිසරයේ යහපැවැත්මට බලපාඇති අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(07) "ස්වාධිපති ජාතික රාජ්‍යයන්ගෙන් අන්තර්ජාතික සමාජය සකස්වී ඇත."

1. එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහය සකස්වී ඇති ප්‍රධාන ආයතනවලින් දෙකක් ලියන්න. (ලකුණු 02)

2. ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම තුළින් අපේක්ෂිත අරමුණු තුනක් ලියන්න. (ලකුණු 03)

3. a ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීමට බලපෑ සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

   b. ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 02)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න